රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 362

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1987 මාර්තු මස 12 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත [illegible]
ඉදිරිපත් කළයුතු විෂයයන්

අමාත්‍යාංශ/රජයේ දෙපාර්තමේන්තු, ආයතන අධ්‍යක්ෂගේ විෂය පථයට නියම වශයෙන් ඇතුළත් නොවන, ආයතන ප්‍රශ්ණ සම්බන්ධ විවිධ කරුණු ඔහු වෙත ඉදි කිරීම කරගෙන යනු ලැබේ. නියම වශයෙන් නම් අදාළ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු තුළදීම විසඳාගත යුතු වන විවිධ කරුණු සම්බන්ධව, වෘත්තීය සමිති/රාජ්‍ය නිලධාරීහුද ඔහු වෙත හා මෙම අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කරති.

02. මෙම අමාත්‍යාංශය හෝ ආයතන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරනු ලබන, එ එසේ කිරීම අවශ්‍ය නොවන කරුණු සමහරක් මෙසේය.

(අ) අදාල අමාත්‍යාංශයේ ලේකම්ගේ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ විෂය පථයට පැහැදිළිවම ගැනෙන, විෂයයන් සම්බන්ධයෙන්, උපදෙස්, නිරීක්ෂණ හෝ විධාන සඳහා ඉදිරිපත් කරන කරුණු. විෂය මැනවින් අධ්‍යයනය නොකරන/අදාල නීති, රෙගුලාසි පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් නොමැති/නිවැරදි බලධාරියා පිළිබඳව නිවැරදි තීරණයක් ගැනීම සඳහා විෂය පිළිබඳ නියම අධ්‍යයනයක් කිරීමේ වගකීම භාර නොගන්නා නිලධාරීහු බොහෝ අවස්ථාවලදී මෙම අංශයට කරුණු ඉදිරිපත් කරති.

(ආ) අදාල අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව ප්‍රතිපත්තිමය තීරණ ගතයුතු හෝ අමාත්‍ය මණ්ඩලය තීරණයක් ගත යුතු කරුණු.

(ඇ) මෙම අමාත්‍යාංශයට යොමු කළයුතුයැයි ලේකම්/අතිරේක ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මට්ටමට වඩා අඩු මට්ටමකදී තීරණය කෙරෙන කරුණු.

03. ආයතන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළයුතු කරුණු පුළුල් වශයෙන් පහත දැක් වර්ගයන්ට ගැනේ.

(අ) නිශ්චිතවම ආයතන අධ්‍යක්ෂගේ/මෙම අමාත්‍යාංශයේ අනුමැතිය හෝ අවසරය ලබාගත යුතු කරුණු. ආයතන සංග්‍රහයෙහි මෙන්ම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල සහ ආයතන චක්‍රලේඛ ලිපිවලද එසේ අනුමැතිය හෝ අවසරය ලබාගත යුතු විෂයයන් දක්වා ඇත.

....2 පිටුව

(ආ) ආයතන සංග්‍රහයෙහි හෝ මෙම අමාත්‍යාංශය නිකුත් කළ චක්‍රලේඛවල හෝ චක්‍රලේඛ ලිපිවල හෝ විධිවිධානයන්හි අර්ථනිරූපණ පිළිබඳ කරුණු.

(ඇ) ක්‍රියා කළයුතු පිළිවෙල හෝ උපදෙස් පිළිබඳ සැකයක් ඇතිවිට හෝ ආයතන සංග්‍රහය/චක්‍රලේඛ ඒ පිළිබඳව කරුණු නොදක්වන විට හෝ ලේකම්ට/අතිරේක ලේකම්ට/දෙපාර්තමේන්තු ප්‍රධානියාට, ආයතන අධ්‍යක්ෂගෙන්/මෙම අමාත්‍යාංශයෙන් තවදුරටත් උපදෙස් නොලබා තීරණයකට එළඹීමට දුෂ්කර ආයතනික කරුණු.

04. ආයතන අධ්‍යක්ෂ/මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළයුත්තේ මෙම කරුණු පමණක් බවත්, එසේද කළයුතු වන්නේ ලේකම්/අතිරේක ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා එසේ කිරීමේ අවශ්‍යතාවය ගැන තමාම/ සෑහීමකට පත්වන අවස්ථාවලදී පමණක් බවත්, කරුණාකර ඔබගේ කාර්ය මණ්ඩලයන්ට උපදෙස් දෙන්නේ නම් කෘතඥ වෙමි. එවැනි ලිපියක් ලේකම්/අතිරේක ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා අත්සන් කර හෝ අනු අත්සන් කර හෝ තිබිය යුතුය.

Siriwardhana

ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

සු/-9